සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
**Co-operative Employees Commission (Southern Province)**
සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2023.05.04 |

චක්‍රලේඛ අංක : **03/2023**

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

<u>විදේශ රැකියා සඳහා නිවාඩු ලබා දීම</u>

වර්තමාන ආර්ථික තත්වය හමුවේ විදේශ විනිමය ඉපයීම සඳහා රැකියා සඳහා විදේශගත වීම ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් විදේශගත වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වන අතර, සමුපකාර සමිති විසින් වරින් වර යොමු කරන ලද ලිපි සලකා බලා මෙකී චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව, විදේශ රැකියා සඳහා නිවාඩු ලබා දීමේදී පහත සඳහන් විධිවිධාන අනුව කටයුතු කරන ලෙස කොමිෂන් සභා නියමය පරිදි දන්වා සිටිමි.

2.1 : සමුපකාර සමිතියක සේවයේ නියුතු කොමිෂන් සභාවේ අනුමැතිය ලද ස්ථිර සේවකයෙකුට විදේශ රැකියාවක් සඳහා යාමට වැටුප් රහිත නිවාඩු ලබා ගත හැකි ය.

2.2 : විදේශ රැකියා සඳහා නිවාඩු අනුමත කිරීම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව විසින් කළ යුතු වන අතර, ඒ සඳහා පහත දැක්වෙන විධිවිධාන අනුගමනය කළ යුතු වේ.

2.2.1: විදේශ රැකියා සඳහා නිවාඩු අවශ්‍ය බව දන්වා නිවාඩු අවශ්‍ය තැනැත්තා විසින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

2.2.2: විදේශ රැකියාවක් පවතින බව සනාථ කර ගැනීමට එනම්, රැකියාව කුමක්ද? කුමන රටේද? රැකියාව සඳහා තෝරාගත් බව, කාලසීමාව යනාදී කරුණු ලිපි ලේඛන මඟින් සනාථ කර ගත යුතු ය.

2.2.3: නිවාඩු ඉල්ලුම්කරුවන්ගෙන් සමිතියට ණය මුදලක් හෝ වෙන යම් මුදලක් අයවීමට ඇත්නම් නිවාඩු අනුමත කිරීමට පෙර එම ණය මුදල් සමිතියට පියවිය යුතු ය. නොඑසේනම් , ණයකරු වෙනුවෙන් එම ණය මුදල සමිතියට ගෙවීමට කොමිෂන් සභා අනුමත සමිතියේ ස්ථිර සේවකයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් විය යුතු ය. නැතහොත් ණය ආපසු ලබා ගැනීමට කිනම් හෝ නිශ්චිත වැඩපිළිවෙලක් තිබේද යන්න ගැන අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව විසින් සොයා බලා සෑහීමකට පත් විය යුතු ය.

2.2.4: විදේශ නිවාඩු අනුමත කිරීමේදී නිවාඩු ඉල්ලුම්කරුට විරුද්ධව විනය හා විගණන විමසුම් පවතීද නොඑසේ නම් එසේ කිරීමට තරම් හේතු සාධක මතු වී තිබේද?(උදා: විගණන පරීක්ෂණයක් මඟින්/තොග ගණන් බැලීමකදී)නැතහොත් විනය පරීක්ෂණයකදී සමිතිය වෙනුවෙන් සාක්ෂි දීමට ඉදිරිපත් වී සිටින අයෙක් ද, සමිතිය සමඟ අනිවාර්ය සේවා ගිවිසුමකට බැඳී සිටින අයෙක් ද යනාදී කරුණු ගැන සැලකිලිමත් විය යුතු ය.(එබඳු අවස්ථාවලින් සේවකයා නිදහස් වී සිටිය යුතු ය)

ලේකම් / செயலாளர் / Secretary } 091-2232794
පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk

2.3 : විදේශ නිවාඩු ලබා දිය යුතු උපරිම කාලසීමාව අවුරුදු 05ක් විය යුතු ය.

2.4 : සේවකයාට දීර්ඝ කාලයක් සඳහා නිවාඩු ලබා දීමේදී එම තනතුරෙහි රාජකාරි කටයුතු අඛණ්ඩව කරගෙන යාමට වැඩපිළිවෙලක් සමිතිය විසින් යෙදිය යුතු වේ.

2.5 : විදේශ රැකියා නිවාඩු අනුමත කිරීමේදී සේවකයාගේ දේශීය ලිපිනයට අමතරව විදේශ රටේ ලිපිනයද සමිතිය විසින් ලබා ගත යුතු වේ.

2.6: විදේශ රැකියා සඳහා නිවාඩු අනුමත කරගත් සේවකයෙකු සමිතිය විසින් අනුමත කරනු ලැබූ නිවාඩු කාලසීමාවක් ඉක්මවා හේතු නොදක්වා සේවයට වාර්තා නොකර සිටීනම්, වහාම සේවයට වාර්තා කරන ලෙසට දන්වා ලියාපදිංචි තැපැලෙන් ලිපියක් ඔහුට යැවිය යුතු ය.

2.7: විදේශගතව සිටින වැටුප් රහිත නිවාඩු කාලය සේවා වරප්‍රසාද සඳහා අදාල කර නොගත යුතු ය.

2.8: සේවකයා සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී ඇත්නම් අදාල මාසික දායකය පෝෂණය කිරීමට සුදුසු ක්‍රමවේදයක් සේවකයා විසින් සලසා ගත යුතු ය.

2.9: සේවක අර්ථසාධක අරමුදල සඳහා වන සේවක දායකය ගෙවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ද සේවකයා විසින් සලසා ගත යුතු ය.

මෙම චක්‍ර ලේඛය කොමිෂන් සභාවේ නියෝගය මත නිකුත් කරන ලදී.

ජයන්ත ජී.ලියනගේ.
ලේකම්(වැ.බ.),
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත :- 01. ලේකම් - කෘෂිකර්ම ගොවිජන සංවර්ධන....සමුපකාර අමාත්‍යාංශය(ද.ප) - දැ.ස.
02. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප) - දැ.ස.
03. දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුව - දැ.ස.